## කතුවැකිය...

03 වෙනි පිටුවෙන්.....

රටේ කලා සංස්කෘතික ප්‍රවාහයට පේරාදෙණියේත්, අනෙකුත් විශ්වවිද්‍යාලයන්ගේත් බලපෑම අවම වූයේ මක්නිසා ද යන්න ගැඹුරින් සිතා බැලීම, සම්පූර්ණයෙන් ම බිඳ වැටුණු ලංකා සමාජය 'යළි සකසා ගන්නේ කෙසේ ද 'යන අද සිදුවන කතිකාවට උපයෝගී කරගත හැකිය.

එදවස පේරාදෙණිය විශ්වවිද්‍යාලය කොළඹින් බැහැර ප්‍රත්‍යන්තයක පිහිටුවන ලද්දේ ගැඹුරු ශාස්ත්‍රීය අරුතකිනි. එහෙත් රුහුණු රජරට ආදී වශයෙන් ආරම්භ වී සෑම පළාතකටම එකක් බැගින් බිහිව ඇති විශ්වවිද්‍යාල යනු එවැනි ශාස්ත්‍රීය උවමනාවක් පෙරදැරිව පිහිට වූ ආයතනවලට වඩා පටු දේශපාලන උවමනාවන් පදනම් කරගෙන බිහිවූ ඒවාය.

අද කැළණිය හා ජයවර්ධන පුර විශ්වවිද්‍යාල වනාහි බණ්ඩාරනායක ආණ්ඩුව විසින් විශ්වවිද්‍යාල බවට පත් කරන ලද ලංකාවේ ප්‍රකට එමෙන්ම දේශීය දැනුම සම්ප්‍රදායක් ගොඩ නැගූ පිරිවෙන් දෙකකි. ඒ ආයතන දෙක විශ්වවිද්‍යාල බවට පත් කළේ බණ්ඩාරනායකට තිබූ ශාස්ත්‍රීය උවමනාවකට වඩා දේශපාලනික උවමනාවක් හේතුවෙනි. විද්‍යෝදය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යලය බවට නාමකරණය වූයේ ඊට අදාළ කිසිදු ශාස්ත්‍රීය හේතුවක් නිසා නොව එවක පාලකයාගේ නමින් විශ්වවිද්‍යාලයක් අවශ්‍ය වූ හෙයිනි. ඒ කුරිරු උවමනාව ඉටු කර ගැනීමට තර්කයක් සම්පාදනය කර ගැනීමට විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය කැලණිය විශ්වවිද්‍යාලය බවට පත් කෙරිණි.

කවර ශ්‍රේෂ්ඨ අරමුණුවලින් විශ්වවිද්‍යාල ආරම්භ කළත් අද සිදුව ඇත්තේ ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල ලංකාවේ දුක්ඛිත සමාජ දේශපාලනික ඉරණමේ ගොදුරු බවට පත්වීමයි.

අප්‍රේල් 6 වෙනිදා Bells & Whistles of Hanthana 2024 ප්‍රසංගය තුළින් අප දුටුවේ ලංකාව පෙලන පොදු දුක්ඛිත සමාජ දේශපාලනික ඉරණමේ ගොදුරු බවට පත් නොවුණු සාමූහික ශාස්ත්‍රීය චින්තනයක් මගින් ලංකාව එකලු කළ ස්වර්ණමය සංස්කෘතික යුගය නැවත ප්‍රති නිර්මාණය කිරීමයි.

එය සාර්ථක වූවා පමණක් නොව තමන්ගේ යටගියාව යළි සිහිපත් කර ගැනීමේ මා හැඟි කාර්යයක් ද එමගින් ඉටුකෙරිණි.

**සංස්කාරක**

# ලොව සතුටුම රට ෆින්ලන්තය



**ලොව** සතුටින්ම සිටිය හැකි රට ලෙස පිට පිට හත්වැනි වරටත් එම කිරුළ දිනා ගැනීමට ෆින්ලන්තය මෙම වසරේ ද සමත් විය.

ෆින්ලන්තය මෙම කිරුළ හිමිකර ගත්තේ, 2024 සඳහා ලෝකයේ සතුටින්ම ජීවත් වන සහ ජීවත් වීමට සුදුසුම රටවල් තේරීමේ දර්ශකයේ මුල් තැනට පත් වෙමිනි.

ලොව සතුටින්ම සිටිය හැකි රටවල් තේරීම සෑම වසරකම සිදුවෙයි. ඒ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීමෙනි. මෙවර, රටවල් 143 ක් සම්බන්ධ කර ගනිමින් ජනමත සමීක්ෂණ පවත්වා, සතුටින්ම සිටින රටවල ලැයිස්තුව සකස් කෙරුණි.

දළ දේශීය නිෂ්පාදනය, වැසියන්ගේ ආයු අපේක්ෂා කාලය, ජීවිතයේ තීරණ ගැනීමට ඇති නිදහස, ත්‍යාගශීලී බව, රාජ්‍ය අංශයේ දූෂිත මට්ටම සහ සමාජ සහයෝගිත්වය යන කරුණු පදනම් කර ගනිමින් ලොව සතුටින්ම සිටිය හැකි රට තේරීම සිදුවෙයි.

ෆින්ලන්තය සැලකෙන්නේ නෝර්ඩික් කලාපීය රටවල් අතරටය. ෆින්ලන්තයට පසු පිළිවෙළින් ලොව සතුටින්ම සිටිය හැකි රටවල් අතරට වෙනත් නෝඩික් රටවල් වන ඩෙන්මාර්කය, අයිස්ලන්තය, ස්වීඩනය සිටී.

ලොව සතුටින්ම සිටිය හැකි රටවල් ලැස්තුවේ අවසන් ස්ථානයේ එනම් 143 වැනි ස්ථානයේ පසුවන්නේ, 2021 වසරේ ඇමෙරිකන් හමුදා පිටවී යෑමෙන් පසු යළි තලේබාන්වරුන්ගේ ග්‍රහණයට නතු වුණු ඇෆ්ගනිස්තානයයි. මෙම ලැයිස්තුවට අනුව, මහා බ්‍රිතාන්‍යය 20 වැනි ස්ථානයේත් ඇමෙරිකාව 23 වැනි ස්ථානයේත් පසුවෙයි.

ශ්‍රී ලංකාව ඇත්තේ 126 වැනි ස්ථානයේය. ඉන්දියාව, පාකිස්තානය, කෙන්යාව, උගන්ඩාව, ටියුනීසියාව යන රටවල් ශ්‍රී ලංකාවට වඩා ඉහළ ස්ථානවල පසුවෙයි.

*(ඒ.එෆ්.පී.)*

# හිටපු ජනාධිපතිවරු 03ක් පාවිච්චි කරපු වාහනවලට රු. කෝටි 200ක පොලු තියලා



**හිටපු** ජනාධිපතිවරුන් විසින් මෙතෙක් කල් භාවිත කළ අධි සුඛෝපභෝගී වාහන හැටකට අධික සංඛ්‍යාවකින් රුපියක් කෝටි 200කට වැඩි කුලී මුදලක් පැහැරහැර ඇති බව දූෂණ විරෝධී හඬ සංවිධානය පවසයි.

මේ වන විට ඉන් වාහන දෙකක් අතුරුදන්ව ඇති බවත් දූෂණ විරෝධී හඬ සංවිධානය කියයි.

තවද ඇතැම් වාහනවල වටිනාකම රුපියල් කෝටි අටකට අධික ඒවා බවද එම සංවිධානයේ කැඳවුම්කරු, ජනතා විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත සමරසිංහ අනාවරණය කර ඇත.

හිටපු ජනාධිපතිවරුන් තිදෙනකු විසින් භාවිත කළ අධි සුඛෝපභෝගී වාහන හැටකට අධික සංඛ්‍යාවකින් ගෙවිය යුතු රුපියල් මිලියන දෙදහසකට වැඩි කුලී මෙසේ පැහැරහැර ඇතැයි වාර්තා වේ.

මෙම වාහන සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්වරුන් වගකිවයුතු බැවින් ජනාධිපති ලේකම් කාර්යාලයට විරුද්ධව ඊට අදාළ නඩුවක්ද පවරා ඇතැයි පැවැසූ සමරසිංහ පෙන්වා දුන්නේ, මෙම වාහන 2006 සිට ජනාධිපතිවරුන් තිදෙනෙක් යටතේ භාවිත කළ ඒවා බවයි.

මෙරට ප්‍රසිද්ධ පෞද්ගලික සමාගමකින් කල්බදු ක්‍රමයට මෙම වාහන කුලියට ගෙන තිබේ.

මේ අනුව, වාහන භාවිත කළේ කුමන ජනාධිපතිවරු ද, ඔවුන් ගෙවිය යුතු මුදල කොපමණද, වාහන අංක ඇතුළු අදාළ තොරතුරු ඉදිරියේදී ජනමාධ්‍ය මඟින් ප්‍රසිද්ධියට පත් කරන බවද හෙතෙම සඳහන් කළේය.

මෙම ගෙවීම් පැහැරහැරීම මත නොගෙවූ මුදලට මාසිකව අය කළ යුතු ප්‍රමාද පොළිය 3%, 4% වන මුදල් අයකිරීමට අදාළ වාහන සමාගම් කටයුතු කර ඇති බවද ඔහු සඳහන් කළේය.

විශේෂයෙන්ම ජනාධිපති වැය ශීර්ෂවලින් හිටපු ජනාධිපතිවරුන් කළේ කුමක්ද යන්න පිළිබඳව මෙහිදී ගැටලුවක් පැනනඟින බවද ඔහු පැවැසීය.

විකිණීමට

මහනුවර ,අම්පිටියේ මනරම් වටපිටාවක, නිල් කඳු ගැට පේන ඉසව්වේ පර්චස් 19.05 සහිත ඉඩම, ගෙදර හා ඊට යාබද ඇනෙක්සිය විකිණීමට. (රු. ලක්ශ 200) AirBnB සදහා කදිමය. ගස් කොළන් මල් වලින් සපිරුණු ගෙවත්ත වටා තාප්පය. ගෙදර නිදන කාමර 2 නාන කාමර 1 ආලින්දය, කෑම කාමරය, මුලුතැන්ගෙයකින් සමන්විතය. ඇනෙක්සිය එක් නිදන කාමරයකින්, නාන කාමරයකින්, ආලින්දයකින් සමන්විත වන අතර ඊටම වෙන්වූ පාරක් ඇත. අම්පිටිය නගරය මිනිත්තු පහක ඇවිදින දුරය, මහනුවර නගරයට වාහනයකින් මිනිත්තු 15 ක දුරය.

CONTACT: **+94 76 418 8013**

Marie Molligoda on whatsapp

**minelshehanie@yahoo.com**